**#mediaethicsSL #SinhalaPress #lka #Ravaya #April29**

වර්තමානයේ ජනමාධ්‍ය තුළ සෘජුව හෝ වක්‍රාකාරීව ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කොට ගනිමින් වෙනස් ලෙසින් සැලකීම සහ විශේෂයෙන්ම කාන්තාව ඉලක්ක කොට ගනිමින් වෙනස් ලෙසින් සැලකීමේ/කොන් කිරීමේ ප්‍රකාශ පළ කිරීම බහුලව දැකිය හැක. පසුගියදා රාවය පුවත්පත තුළ සමස්ත වශයෙන්ම මෙවැනි ස්වරයකින් යුක්ත ලිපියක් පළවූ අතර, එය සමාජ මාධ්‍ය ජාල පුරා කථා බහට ලක් විය.

මෙම තීරු ලිපියේ "ගෑණු පත්තර", "පත්තරත් නිකං ගෑණු වගේ අන්තිම වපලයි", "සල්ලි තියෙනවා නම් විතරනේ පත්තරේ වුනත් ගහන්න පුලුවන්" වැනි වැකි කොටස් දක්නට ලැබුණු අතර, කාන්තාව කොන් කිරීමට ලක් කෙරෙන මෙවැනි යල් පැන ගිය ආකෘතිගත කිරීම්, ද්විඅර්ථ වැකි සමාජ වගකීමක් රැගත් පුවත්පතක් හරහා සමාජ ගත කිරීම තරම් වේද යන්න පැනයකි. මෙම තීරු ලිපිය සඳහා පසුබිම් වන සිදුවීමක් හෝ සිදුවීම් දාමයක් තිබිය හැක. ඊට ගැලපෙන ලෙසින් වක්‍රෝත්තීන් හරහා තීරු ලිපි රචකයා විසින් අදහස් ප්‍රකාශ කොට තිබෙනවා විය හැක. නමුත් ඒ සඳහා කාන්තාව සෘජුව පහත හෙළනා මෙවැනි වැකි සමාජගත කිරීම පිළිගත හැකිද?